# 2023

## කාර්යසාධන වාර්තාව
## செயலாற்றல்  அறிக்கை
## PERFORMANCE REPORT

මහා භාරකාර දෙපාර්තමේන්තුව

**பொதுநம்பிக்கைப்  பொறுப்பாளர்திணைக்களம்**

Department of Public Trustee

<u>2023.12.31 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව</u>

**<u>ආයතනයේනම - මහා භාරකාර දෙපාර්තමේන්තුව</u>**

**<u>වැය ශීර්ෂ අංකය - 205</u>**

**අන්තර්ගතය**


පරිච්ඡේදය01 - ආයතනිකපැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධනඅරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1.හැඳින්වීම

<u>මහා භාරකාර ධූරය සහ නෛතික ශක්නුතාවය.</u>

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ අඥා පනත් මඟින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින්ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මඟින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාර ධූරය, ස්වාධීන අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිත කොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්නුතාවයක් සහිත වේ.

<u>නෛතික පසුබිම</u>

ශ්‍රී ලංකාව තුළ මහා භාරකාර ධූරය ස්වාධීන හා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිතව ස්වාධීන කොට ඇති අතර නාමයෙන් ස්වාධීන නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇත. ඒ අනුව මහා භාරකාර ධූරය හා ආයතනය අදාළ ආඥා පනත් අනුව පාලනය වේ.

1. 1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මඟින් ද 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින්ද 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත
2. 1938 අංක 04, 1934 අංක 11 දරණ ආඥා පනත් මඟින්ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මඟින් ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බල පැවැත්වෙන අතර එකී පණත නිහඬවන්නා වූ යම් අවස්ථාවකදී ඉංග්‍රීසි නීතියේ ඇති සමානාත්මතා මූලධර්මය (LAW OF EQUITY)
3. මීට අමතරව සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මඟින් මහා භාරකාර තැන වෙත කාර්ය භාරයන් පැවරී ඇත.
4. මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව මහා භාරකාරතැන වෙත පහත කාර්යයන්ද පැවරී ඇත.
    - 1988 අංක 61 දරණ පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගතවන්නන්, විදේශයකදී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් / නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදාදීම සහ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරයන ශ්‍රී ලාංකික පුරවැසියන් සේවා නියුක්තියෙහි යෙදී සිටියදී මරණයට පත් වූ අවස්ථාවක යම් වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු තැනැත්තන්ගේ නම් මහා භාරකාරවරයා වෙත ලියාපදිංචි කරවා ගැනීම.
    - 1944අංක 28 දරණ විහාර වන්දි ආඥා පනත ක්‍රියාත්මක කිරිම.
    - 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.
    - 1973 අංක 28 දරණ විශේෂ විධිවිධාන පනත යටතේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සමාගමේ කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර

__දැක්ම__

1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ සහ 1917 අංක 09 දරන භාර ආඥා පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව, ශ්‍රී ලංකා ජනරජය තුල වලංගුව පවතින නෛතික රාමුව යටතේ, විශ්වාසනීයත්වයෙන්, අපක්ෂපාතීත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව, ශ්‍රී ලංකාවේ මහා භාරකාර තුමා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සද්භාවයෙන් ස්වකීය වෘත්තීමය වගකීම් සහ යුතුකම් සපුරා ඉටු කිරීම.

__මෙහෙවර__

ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සියලුම බලතල සහ වගකීම් නෛතික රාමුව තුල විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරිම සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත විශ්වාසය තබමින් සේවාවන් ලබා ගැනිම සඳහා පැමිණෙන පාර්ශවයන්ට අපක්ෂපාතීව හා කාර්යක්ෂමව උපරිම සේවයක් විනිවිදභාවයෙන් යුක්තව ලබාදීම සහ ඒ තුළින් ශ්‍රී ලංකා මහා භාරකාර දෙපාර්තමෙන්තුවේ දේශීය මෙන්ම ජාත්‍යන්තරයේ ද කීර්තිනාමය වර්ධනය වන සහ පැසසුමට ලක් වන ආකාරයට කටයුතු කිරීම.

## 1.3ප්‍රධාන කාර්යයන්

__මහා භාරකාරතැනගේ බලතල සහ කාර්යභාරය.__

මහා භාරකාර ආඥා පනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාර තැන වෙත පැවරී ඇත.

- සමාන්‍ය භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
- රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
- දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරීම.
- බාලවයස්කරුවකුගේ දෙපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම.(දිසා අධිකරණ මඟින් පවරන ලද අවස්ථාවක)
- සිහි විකල් පුද්ගලයෙකුගේ දේපල කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.(දිසා අධිකරණ මඟින් පවරන ලද අවස්ථාවක)
- නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවලදී එම භාරයන් හි පත්කර ඇති භාරකාර මණ්ඩලය මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී.)
- විදේශගත වූ ශ්‍රී ලාංකිකයකුගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
- සිවිල් නඩුවිධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මඟින් නියෝග කරන ලද දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
- ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවලදී අන්තිම කැමතිපත්‍රයක් රහිත පුද්ගලයෙකුගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
- වරදට සිරගතවූවකු දේපළ කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම.
- ඕනෑම පුද්ගලයෙකුගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.

**<u>මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් පාලනය වන භාර සහ බුදල් සංඛ්‍යාව</u>**

2023.12.31 දිනට දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන භාර සංඛ්‍යාව 934 ක් වන අතර බුදල් සංඛ්‍යාව 93 කි.

**<u>මහාභාරකාර දෙපාර්තමේන්තුවෙන් සැලසෙන සේවාවන්.</u>**


මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව / අන්තිම කැමති පත්‍රවල ඇති අරමුණු අනුව / අධිකරණ නියෝග මත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය සපයනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත්දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාරඅවශ්‍ය රෝගීන් ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෛද්‍ය ආධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවලඅරමුණු අනුව මූල්‍ය මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු
- විවිධ හේතූන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහඑවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- භාර/බුදල් මුදල් දේපළ කළමනාකරණය කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරා ගන්නා ලද නිශ්චල දේපල සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ මත බෙදාහැරීම
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය
- විදේශවන්දි ලෙස ලැබෙන මුදල්යැපෙන්නන් හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

ඉහත කාර්ය භාරය ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුල පහත අංශ ස්ථාපිත කර ඇත.

1. ආගමික අංශය
2. වෛද්‍යාධාර අංශය
3. ශිෂ්‍යාධාර අංශය
4. පුද්ගල භාර අංශය
5. විමර්ශන අංශය
6. වතු අංශය
7. ගිණුම් අංශය
8. පාලන අංශය
9. විහාර වන්දි අංශය
10. විදේශ වන්දි අංශය
11. අභ්‍යන්තර විගණන අංශය

# සංවිධාන සටහන - මහා භාරකාර දෙපාර්තමේන්තුව



**පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**විශේෂ ජයග්‍රහන , අභියෝග හා ඉදිරි ඉලක්ක**

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ**

මෙම දෙපාර්තමේන්තුව මඟින් භාර දේපල පරිපාලනයහා භාර වල අරමුණු ඉටු කිරීම සිදු කෙරේ. ඒ අනුව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ භාර අරමුදල් මඟින් වේ.

## 2.1 වතු පරිපාලනය

කාලයක් පුරා අලාභ ලබමින් තිබුණු වතු බදු දීම සඳහා කටයුතු කරමින් පවතී. අනෙකුත් වතු සඳහා ආදායම් ඉලක්ක ලබාදී ඇති අතර විවිධ අභ්‍යන්තර පාලන උපක්‍රම අනුගමනය කිරීම තුළින් වියදම් අවම කර ආදායම වැඩි කර ගැනීමට කටයුතු කර ඇත.

## 2.2 දේපල පරිපාලනය

උසාවි නියෝග මත හෝ අන්තිම කැමති පත්‍ර මඟින් පවරන ලද නිවාස හා වෙනත් දේපළ මෙම දෙපාර්තමේන්තුව සතුව පවතී. එම දේපල වලින් ලැබෙන ආදායමෙන් එහි හිමිකරුවන්ගේ අරමුණු ඉටු කිරීම සිදුවේ. මේ යටතේ පුණ්‍යාධාර ගෙවීම හෝ ඔවුන්ගේ භාරකරුවන් රැකබලා ගැනීම ආදී කටයුතු ඇතුළත් වේ. දෙපාර්තමේන්තුව සතු මෙතෙක් හඳුනා ගැනීමට නොහැකි වූ දේපළ සොයා ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර දේපල ලයිස්තුවක් සකස් කර සියලුම දේපල ලේඛනගත කිරීම සඳහා කටයුතු කරමින් සිටී. එසේම දැනට තිබෙන තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම තුළින් සියලුම දේපල වලට අදාල තොරතුරු පද්ධතියට ඇතුලත් කර සංරක්ෂණය කිරීමට ඉලක්ක කර ඇත. එසේම අනවසර අල්ලා ගැනීම් පිළිබඳව පොලීසිය, ප්‍රාදේශීය ලේකම්, උසාවියේ සහයෝගයෙන් නිරවුල් කිරීමට ඉදිරි පියවර ගෙන ඇත.

## 2.3 භාර ආධාර වැඩසටහන්

මේ යටතේ ආගමික, පුද්ගලභාර, වෛද්‍යාධාර හා ශිෂ්‍යාධාර ලෙස ආධාර ක්‍රම ක්‍රියාත්මක වේ.

මෙම වසරේ පොළී ආදායම හා අනෙකුත් ආදායම් වැඩිවීම නිසා වැඩි අරමුණු ප්‍රමාණයක් ඉටුකර ගැනීමට හැකි වූ අතර ඉල්ලීම් අනුව විශාල වශයෙන් ආධාර ලබා දෙන ලදී.

හුස්ම ගන්නට තරම් පෙනහළු ශක්තිමත් නැති අලුත උපන් නොමේරු දරුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීමට අත්‍යවශ්‍ය ‘Surfactant’ ඖෂධය ලබාගැනීම සඳහා සිසිල් වනිගසූරිය භාරයේ 2023 වර්ෂයේ භාර අරමුණු ඉටු කිරීම නිමිති කොටගෙන 2023.11.02 දින මහා භාරකාර තැන සහ නියෝජ්‍ය භාරකාරතැන ගේ සහභාගීත්වයෙන් ‘Save a baby’ ව්‍යාපෘතිය වෙනුවෙන් මුල්‍ය ආධාර ලබා දෙන ලදී.



1988 වසරේ ඩී. ආර් . වික්‍රමරත්න මහතා විසින් ස්ථාපිත කරන ලද මෙම භාරයේ එක් අරමුණක් වන්නේ කොළඹ කාසල් විදියේ කාන්තා රෝහල වෙත ඇසුරුම් කළ ආහාර ලබා දීමයි. ඒ අනුව 2023.11.27 දින එම වියළි ආහාර රෝගීන් වෙත බෙදා දීම සිදු කරන ලදී.





**ආගමික ආධාර**

අන්තිම කැමති පත්‍රය සහ භාර ඔප්පුවල ඇති අරමුණු පරිදි ආගමික සිද්ධස්ථාන සහ ආගමික ස්වරූපයේ ආයතනයන්ට නීත්‍යානුකූලව ගිවිසුම් ප්‍රකාරවගෙවීම් කිරීම සහ ආධාර ලබාදීම මේ යටතේ සිදුකරයි.

යූ.ඩී.බී. ද සිල්වා මහතාගේ 13වන ගුණානුස්මරණය වෙනුවෙන් ඔහුගේ අවසන් කැමති පත්‍රයේ විධි විධාන අනුව 2023.04.01 වන දින භික්ෂු භික්ෂුණීන් වහන්සේලා 35 නමක් වෙනුවෙන් දානමය පින්කමක් ගරු මහා භාරකාරතැනගේ ප්‍රදානත්වයෙන් මහාභාරකාර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී පැවැත්වුණි.





**පුද්ගලභාර ආධාර**

දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති භාර හා අන්තිම කැමතිපත්‍ර වලින් මහා භාරකාර තැන පොල්මංකරු වශයෙන් පත් කර ඇති බූදල් අතරින් අර්ථලාභියා නිශ්චිතව සඳහන් කර ඇති භාර හා බූදල් වලට අදාල අරමුණු ඉටු කිරීමටද පොදු අරමුණක් නොවන පුද්ගලික අරමුණු මුල් කර ගනිමින් ඇති කල භාර වේ. ඒ අනුව ගෙවීම් සිදු කෙරේ.

එස්.ඊ.ජේ.ෆයර් භාරය මඟින් අනුරාධපුර හා පොළොන්නරුවේ අඩු ආදායම්ලාභී පවුල් 80 ක් සඳහා ආධාර ලබා දෙන ලදී.

**වෛද්‍යාධාර**

අන්තිම කැමති පත්‍ර සහ භාරයන්හි අරමුණු ප්‍රකාරව රෝහල් වෙත හා රෝගී පුද්ලයන් වෙත මූල්‍ය පහසුකම් හා වෛද්‍යාධාර ලබා දීම සිදුවේ. අයදුම්පත්‍ර කැඳවීම මඟින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරයි.

1982 දී පූජ්‍ය යටිනුවර ඉන්ද්‍රරතන හිමියන් විසින් ස්ථාපිත ශ්‍රී ලංකා දැඩි උපස්ථායක ඒකක පදනම් භාරයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකා ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයට අවශ්‍ය ඖෂධ, උපකරණ ලබා ගැනීම සඳහා ආධාර ලබා දීමයි. එම භාරයේ අදායමින් 2023 ඔක්තෝම්බර් 23 දින කපු පුළුන් ග්‍රෑම් 500 රෝල් 139ක් කොළඹ ජාතික රෝහල වෙත මහා භාරකාර දෙපාර්තමේනතුවේ නිලධාරීන් විසින් 2023 ඔක්තෝම්බර් 23 දින ලබා දෙන ලදී.



**ශිෂ්‍යාධාර**

භාරයේඅවසන් කැමතිපත්‍රයේ ප්‍රධානඅරමුණශිෂ්‍යාධාරලබාදීමලෙසසඳහන් කරපිහිටුවාඇතිභාරවේ. ඒ අනුව අවසානකැමතිපත්‍රවලඅරමුණුඉටුකිරීමමේ යටතේ සිදු වන අතර පාසල් සහ විශ්ව විද්‍යාල මෙන්ම අධ්‍යාපනය ලබන දරු දැරියන් වෙත ශිෂ්‍යාධාර ලබා දෙයි.

### 2.4 විදේශ වන්දි

විදේශගතව රැකියාවක නිරත පුද්ගලයෙකු මියයාම හා ආබාධිත වීම වැනි අවස්ථාවලදී ඔහු වෙනුවෙන් ලැබෙන වන්දි මහාභාරකාර දෙපාර්තමේන්තුව වෙත ලැබේ. ඒවා නියමිත උරුමකරුවන් හා යැපෙන්නන් හඳුනා ගෙන ඔවුන්ට ගෙවීම සිදු වේ.මේ ආකාරයට 2023 වර්ෂය තුල රු. 449,329,391.72 ක් ගෙවීම් සිදුකර ඇත.

### 2.5 විහාර වන්දි

1944 අංක 28 දරන පන්සල් ඉඩම් වන්දි ආඥා පනත අනුව රජයේ කාර්යයන් සඳහා අත්පත් කර ගැනීමේදී ලබා දෙනු ලබන වන්දි මුදල් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ හා මහා භාරකාර තැනගේ ගෙවීම් කිරීමද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුවේ. මේ අනුව 2023 වර්ෂය තුළ එක මුදලක් විහාර වන්දි ලෙස රු.284,344,362.73 ක් ගෙවීම් කර ඇත.

### 2.6 නෛතික කටයුතු

මෙම දේපළ බූදල් සම්බන්ධව නඩු කටයුතු බහුලව පවතී. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 03 දිසා අධිකරණයේ නඩු 83 සිවිල් අභියාචනා අධිකරණයේ නඩු 05 ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 02 ගොවිජන විනිශ්චය සභාවේ නඩු 47 ලෙස දැනට නඩු සංඛ්‍යාව 140 කි. නීති හා විමර්ශන ලෙස වෙනම අංශයක් පිහිටුවා ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

**2.7 රජයේ ආදායමට මුදල් ප්‍රේෂණය කිරීම**

1990 ඔක්තෝම්බර් 08 දිනැති 944/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මූලධන ගාස්තු, ආදායම් ගාස්තු, ආයෝජන ගාස්තු . භාරකාර ගාස්තු, සේවා ගාස්තු හා දෙපාර්තමේන්තු ගාස්තු ලෙස භාර හා බූදල් වලින් අය කර රජයේ ගාස්තු මුදල් ලෙස මාසිතව රජයේ ආදායමට බැර කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂය තුළ රු. 15,381,686.45 මුදලක් රජයේ ආදායමට බැර කර ඇත.

ගිහාන් පිලපිටිය

ශ්‍රී ලංකාවේ මහා භාරකාරතැන

**03 පරිච්ඡේදය -2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය**

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය (ඒසීඒ - එෆ්)

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය 2023 | තත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 55,751,000 | 52,076,000 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 57,070 | 72,465 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,028,195 | 3,754,695 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **61,836,265** | **55,903,160** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **61,836,265** | **55,903,160** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 375,521 | 3,890 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **61,460,744** | **55,899,270** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 44,100,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 40,921,359 | 40,839,676 | ඒසීඒ-2(ii) |
| 36,249,750 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 31,793,980 | 27,243,982 | ඒසීඒ-2(ii) |
| 400,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 252,977 | 198,662 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | - | |
| **80,749,750** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **72,968,316** | **68,282,320** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 3,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 2,731,852 | 952,421 | |
| 1,750,250 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 1,625,913 | 990,565 | **ඒසීඒ-2(ii)** |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | **14** | 333,962 | 435,318 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| **5,250,250** | **මුළු මූලධන වියදම් (උ)** | | **4,691,727** | **2,378,304** | |
| | තැන්පතු ගෙවීම් | | 57,070 | 72,465 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 6,305,186 | 4,275,325 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **6,362,256** | **4,347,790** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **84,022,299** | **75,008,414** | |
| **86,000,000** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(22,561,555)** | **(19,109,144)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(22,561,555)** | **(19,109,144)** | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **ඒසීඒ-3** |
| | | | **(22,561,555)** | **(19,109,144)** | |

3.**2** 202**3 දෙසැම්බර්** 31**දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ -පී)**

ඒසීඒ-පී

## 2023 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | සත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 54,245,380 | 35,511,536 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 11,390,866 | 11,113,875 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **65,636,246** | **46,625,411** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය මත ශුද්ධ වත්කම් | | 11,390,866 | 11,113,875 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 54,245,380 | 35,511,536 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **65,636,246** | **46,625,411** |

පිටු අංක 7 සිට 23 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති සම්පූර්ණ කර ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 24 සිට 30 දක්වා ඇතුළත් ගිණුම් සටහන් ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පරිපාලනය කිරීම ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමෙන් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වගකීම් වර කාලානුරූපව සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| | තනතුර : | |
| | දිනය : 2024/02/26 | දිනය : 2024/02/26 |

**3.3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ -සී)**

| | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 23,009,495 | 20,770,857 |
| අග්‍රිම ලැබීම් | | 55,751,000 | 52,076,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 6,305,542 | 3,237,362 |
| තැන්පතු ලැබීම් | | 57,070 | 72,465 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **85,123,107** | **76,156,684** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 72,796,916 | 68,218,360 |
| සහනාධාර සහ මාරුකිරීම් | | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 1,124,542 | 1,383,330 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 375,521 | 3,890 |
| අත්තිකාරම් ගෙවීම් | | 6,077,331 | 4,100,335 |
| තැන්පතු ගෙවීම් | | 57,070 | 72,465 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **80,431,380** | **73,778,380** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **4,691,727** | **2,378,304** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| මූලධන වියදම් | 4,691,727 | 2,378,304 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **4,691,727** | **2,378,304** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(4,691,727)** | **(2,378,304)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **-** | **-** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

**3.4 වාර්තා කිරීමේ පදනම**

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙමමූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහරවත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනමමත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලටඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාවනොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක්ඇති විට හා එමවත්කම් විශ්වාසනීයව මැනියහැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතියඅදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියතහාඋපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියතහාඋපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.5**ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (රු. ,000)

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතුකරනලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.02.99 | පොළිය, අනෙකුත් | 450 | 450 | 432 | 96% |
| 2003.99.00 | විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම් | 11,000 | 11,000 | 20,714 | 188% |

**3.6**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය (රු.,000)

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 81,000 | 80,750 | 72,968 | 90% |
| **ප්‍රාග්ධන** | 5,000 | 5,250 | 4,691 | 89% |

**3.7**මු.රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

**3.**8 මූලා නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනයරු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූලා තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 54,245 | 54,245 | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.09 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. [illegible]/2/2023/07
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 මැයි 31 දින

මහා භාරකාර තැන
මහා භාරකාර දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩිත වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය-තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ ඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.3 | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | 1.6.2 |

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී අයිතිය පවරා ගෙන තිබූ වාහන දෙකකට අදාළ වටිනාකම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන ඇප ලේඛනයක් පවත්වා ගෙනයාමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස පත් වූ විනිසුරුවරයාට විනිසුරු දීමනා ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර නොගැනීම හේතුවෙන් වැය විෂය සංකේතාංක 1003 වෙනත් දීමනා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66/99 මාරු පත්‍ර මඟින් රු.840,000 ක මුදලක් ද මාරු කර ගෙන තිබුණු අතර 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි 2 (ඇ) (iii) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් සියයට 6ක ප්‍රතිපාදන ඉතිරි කිරීමට ද නොහැකි වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලෙහි වැඩිදියුණු කිරීමේ වියදම්, ගොඩනැගිලි හිමිකරුගේ භාරයෙන් දරනු ලැබුවද, ඒ සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් ද ගොඩනැගිලි සහ ඉදිකිරීම් (2001) යටතේ 2021, 2022 සහ 2023 වර්ෂවල රු.300,000ක් බැගින් ප්‍රතිපාදන වෙන් කර ගැනීම හේතුවෙන් වර්ෂ 03හි පිළිවෙලින් සියයට 40 ක්, සියයට 63 ක් සහ සියයට 77 ක් වශයෙන් අනවශ්‍යව ඉතිරි කිරීම් පැවතුණු බවට නිරීක්ෂණය විය.

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

දෙපාර්තමේන්තුවට අදාළ නොවන වැය විෂය අංක 205-126-2-7-35-2401-12-P යටතේ රු.949,560 ක වටිනාකමින් යුත් බැරකම්, 2023 දෙසැම්බර් 31 දිනට SA-92 භාණ්ඩාගාර පරිගණක මුද්‍රණය තුළ ඇතුළත්ව තිබුණ ද, ඒ පිළිබඳව භාණ්ඩාගාරයට දැනුම් දී එම මුද්‍රණය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආයතනයට අදාළ වාර්ෂික වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.3 (අ) ඡේදයෙහි සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ 47(1) වගන්තිය | භාර/ මුදල් ගිණුම් වාර්ෂිකව විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ භාර/ මුදල් අවසාන ගිණුම් මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5, 4.5, 4.6 සහ 6.3 උපවගන්ති | විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු, වසරක් ඉක්ම වූ රු.137,500 ක ණය මුදල, අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | 268(අ) පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ, ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ පවතින වාහන 06 ක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 756 (6) | 2022 වර්ෂයට අදාළව එම වර්ෂයේ දෙසැම්බර් 15 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම දින 18ක් ප්‍රමාද කර සිදු කර තිබීමත්, මාර්තු 15 දිනට පෙර අවසන් කළ යුතු භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 ජුලි 20 දින අවසන් කර තිබීමත්, මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023 ජුලි 14 දින ඉදිරිපත් කර තිබීමත්, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධ සියළු කටයුතු නිම කර අප්‍රේල් 10 දිනට පෙර සිදු කළ යුතු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම 2023 ජුලි 14 දින සිදු කර තිබීමත් අනුව චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වී නොමැති බවට නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ඉ) | 2008 ජුනි 26 දිනැති අංක 13/ 2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිල වාහන සඳහා අනුයුක්ත කර ඇති සියලුම රියදුරන් 2008 ජුනි 26 දිනැති අංක13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම - 01 ආකෘතිය පරිදි වාහනය පාවිච්චි කරන නිලධාරියාගේ නම, තනතුර, ගමන ආරම්භ කළ හා අවසාන කළ වේලාව, වාහනය ධාවනය කළ කිලෝ මීටර ගණන, රියදුරුගේ අත්සන ආදී තොරතුරු පවත්වාගෙන යා යුතු වුවත් දෙපාර්තමේන්තුවෙහි සියලුම නිල වාහන සඳහා එම ආකෘතිය පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඊ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර ඉන්ධන භාවිතයේ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි දක්වා ඇති පරිදි මාසික ප්‍රවාහන සේවා සටහන සම්පූර්ණ කිරීමට ද කටයුතු කර නොතිබුණි. |
| (උ) | බස්නාහිර පළාත් සභාවට අදාළ 2008 අංක 01 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය | බස්නාහිර පළාත තුළ පිහිටි සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්ම ළමා සංවර්ධන ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය ලබා ගත යුතු වුවද, සිල්වා විජේසිංහ ස්මාරක නිවාසය සම්බන්ධයෙන් එකලස ලියාපදිංචිය ලබා ගැනීමට හෝ අදාළ දේපළ හිමිකරුගේ අන්තිම කැමති පත්‍රයේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර නීතිමය ගැටළු නිරාකරණය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

2022 දෙසැම්බර් 31 දිනට භාර/මුදල් සම්බන්ධ බැංකු ගිණුම් 08ක එකතුව රු.14,017,724 ක හර ශේෂයක් ඇතිවන පරිදි වියදම් දරා තිබූ අතර ඉන් භාර/මුදල් 04කට අදාළව එකතුව රු.1,325,481 ක හර ශේෂයක් පියවීම සඳහා එම මුදල්වල කිසිදු ආයෝජනයක් ද නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට

පෙර සකස් කර ප්‍රධාන ගණකාධිකාරී නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම 2023 පෙබරවාරි 06 දින සිදු කර තිබුණි.

(ආ) 2023 කාර්යසාධන වාර්තාව අනුව විකුණුම් ගාස්තු හා අනෙකුත් ලැබීම් ලෙස ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.11,000,000 ක් වුවද, රැස් කළ ආදායම රු.20,714,000 ක් හෙවත් ඇස්තමේන්තුගත අගයට වඩා සියයට 188 කටත් වැඩි අගයක් විය. මෙය ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතාවයක් බවට නිරීක්ෂණය විය.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව, භාර/මුදල් අරමුදල්වලට අදාළ ක්‍රියාකාරකම් වෙනුවෙන් පුද්ගල භාර ගෙවීම් රු. මිලියන 14 ක් සහ භාර අරමුණු අනුව වෙනත් ගෙවීම් රු. මිලියන 5.7 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, වැය කිරීම පිළිවෙලින් රු.මිලියන 22.2 ක් සහ රු.මිලියන 9.8 ක් විය. ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා මීට හේතු වී ඇති බවට නිරීක්ෂණය විය.

### 3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යසාධන දර්ශක අනුව සත්‍ය නිමවුම් හා අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී වතු කළමනාකරණ අංශයේ මුදල් 07කට අයත් වතු 11කින් 2023 වර්ෂයේ අපේක්ෂිත ලාභය රු.19,581,285ක් වුවද, ඒවායෙහි රු.5,008,264ක අලාභයක් ඇතිවී තිබුණු අතර එහි ප්‍රතිශතය අපේක්ෂිත ලාභයෙන් සෘණ සියයට 26ක් විය.

### 3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 අගෝස්තු 09 දින පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවෙහි තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කිරීමටත් සහ ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සිංහසිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස්වල භාරකාරීත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවද එම කාර්යය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශකයක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මාණ්ඩලික නිලධාරියකුගේ අනුමැතිය සහිත ගේට්ටු අවසර පත්‍ර භාවිතා නොකර දෙපාර්තමේන්තුව සතු වාහන කාර්යාලයෙන් බැහැර ගෙන ගොස් තිබුණි.

(ආ) 2023 ජුනි මස සිට අක්‍රීය තත්ත්වයේ පවතින විවිමන්ඩි මන්දිරයේ කාර්යාල කටයුතු සඳහා භාවිතා කරනු ලබන ෆැක්ස් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට හෝ භාණ්ඩ සමීක්ෂණයේදී ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන වතු සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I) එන්.ඩී.එස්.සිල්වා විශේෂඥ මුද්‍රල්කරුගේ කළුතර පළාතට පිහිටි විවිමන්ඩි කාසල් ගොඩනැගිල්ල ඇතුළු දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) මහාභාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින පෞරාණික වටිනාකමකින් යුත් කළුතර පළාතට පිහිටි විවිමන්ඩි කාසල් ගොඩනැගිල්ල, නිසි කාලය තුළ විධිමත් පරිදි නඩත්තු කටයුතු සහ අළුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් වහලයෙන් ජලය කාන්දුවී බිත්තිවලට හානි සිදුවී තිබුණු අතර ඇතැම් ස්ථාන පෞරාණිකත්වයට නොගැළපෙන ආකාරයට අළුත්වැඩියාවන් සිදු කර ඇති බවට නිරීක්ෂණය විය. ඒ අනුව නැවත අළුත්වැඩියාවක් සිදු කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් තත්ත්ව වාර්තාවක් ලබා ගෙන තිබුණ ද අරමුදල් සපයා ගැනීමේ නොහැකියාව මත අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකිව තවදුරටත් මන්දිරයට හානි සිදුවෙමින් පැවතුණි.

(ii) මෙම මන්දිරයෙහි සිදු කළ යුතු හදිසි සහ අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් වෙනුවෙන් 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව රු.755,335 ක් වැය කර එයින් රු.3000ක පමණක් රැඳවුම් මුදල් ලෙස අඩු කරගෙන තිබුණ ද, තවදුරටත් ජල කාන්දුවීම් සිදු වී සිවිලිමට සහ බිත්තිවලට හානි සිදු වෙමින් පැවති අතර පසුව ඇස්තමේන්තුවක් පිළියෙල නොකර විෂයභාර ලිපිකරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් මත ද්‍රව්‍ය සඳහා රු.185,665 ක් හා වැඩ කුලී සඳහා රු.722,105 ක් වැයකර මන්දිරයේ පිටුපස බිත්තිවල පමණක් අඩි 12,122 ක ප්‍රමාණයක් නිසි ක්‍රමවේදයකින් තොරව කඩතොළු සහිතව තීන්ත ආලේප කර තිබුණි.

(iii) විවිමන්ඩි පාර්ක් වත්තේ ඇති අක්කර 03 ක රබර් වගාව ඉවත් කිරීමෙන් ලැබෙන ආදායමින් කුරුඳු වගා කිරීමට යෝජනා කර පසුව කුරුඳු වගාව නොකර වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබූ පොල් පැල රු.678,700 ක වියදමකින් මාස 7කට වැඩි කාලයක් ගත කර වගා කිරීමට කටයුතු කර තිබුණු අතර එම වගාවන්හි සාර්ථකත්වය පිළිබඳ සනාථ නොවීය.

(iv) විවේකානන්ද පාර්ක් වත්තේ පොල් වගාවේ ආරක්ෂාව සඳහා රු.406,100 ක වියදමින් කොන්ක්‍රීට් කණු යෙදූ කම්බි වැටක් ඉදිකර තිබුණ ද සිටුවන ලද පොල් පැලවලින් පැල 28ක් පමණක් ඉතිරිව තිබීමෙන් වැටෙන් අපේක්ෂිත ආරක්ෂාව ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(v) මුදල්කරුගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ, මන්දිරයෙහි කැන්පත් කර සංරක්ෂණය කළ යුතු බව සඳහන් කර තිබුණ ද ඒ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ ගේට්ටුවක තබා ඇති බවත් අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව සොයා බැලීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ii) 2020 වර්ෂයේදී හොරණ කෝප් වත්තේ පැවති අක්කර 6ක රබර් වගාව ඉවත් කර පොල් වගා කිරීම සඳහා රු.247,272 ක වියදමකින් භූමිය සකස් කර පසුව එම භූමිය ද ඇතුළත්ව අක්කර 10.592 ක් 2021 වර්ෂයේ සිට පෞද්ගලික ඉදිකිරීම් ආයතනයකට බදු දී තිබීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්ඵල බවට පත්ව තිබුණි. තවද, රබර් වගාව ඉවත් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු ගිවිසුම ප්‍රකාරව, ප්‍රමාද වූ දින 90ක් සඳහා දිනකට රු. 1000 ක් බැගින් අයකර ගත යුතු වූ රු. 90,000 ක ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට ද, එම වත්තට යවා තිබුණු පොල් පැළ 293කින් පැල 33ක ඌනතාවය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) එයි.ඩබ්ලිව්.සී. විජේරත්න මුදලයට අයත් කෝට්ටෙන් බුර්ගි පිහිටි නිවස හා ඉඩම 1993 දෙසැම්බර් 07 දින වැඩිහිටි නිවාසයක් පවත්වා ගෙන යෑම සඳහා ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදී තිබුණ ද එම දේපළ භාරදීම හා නඩත්තු කිරීම යනාදී කරුණු ඇතුළත් විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඉ) සී. ඩී. වනිගසූරිය මුදලයට අයත් දේපළ විකුණා මුදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 වර්ෂයේදී අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලැබී තිබුණ ද ඇතැම් ඉඩම් කොටස් සහ ඒවා ඇතුළත් ගොඩනැගිලිවල හිමිකාරීත්වය භාරගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු වන පරිදි ආරක්ෂා කිරීමටත්, එම දේපළ විකුණා මුදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතු කර නොතිබුණි.

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 පාඩු හා හානි

අංක 65 - 0763 දරන වාහනයට 2007 ජනවාරි 27 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් වූ රු. 254,038 ක අලාභය, අදාළ රියැදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නිෂ්ප්‍රභ වී තිබූ අතර අනතුර සිදු වී වසර 16 ක් ගත වුවද අදාළ පාඩුව වගකිව යුතු අයගෙන් අය කර ගෙන පොත්වලින් කපා හැරීමට සුදුසු පියවර ගෙන නොතිබුණි.

### 3.5 අනාර්ථික ගනුදෙනු

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් 2022 වර්ෂයේදී ලබා දුන් මෝටර් රථ 02ක් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.406,270 ක වියදම් දරා තිබුණ ද, එම රථ ධාවනයට යොදවා නොතිබීමෙන් අළුත්වැඩියා වෙනුවෙන් දරන වියදම් නිෂ්කාර්යවන් මෝටර් රථ ලබා උපයෝගීතාවක් පැවතුණි.

### 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විවේකානන්ද මන්දිරය නැරඹීමට පැමිණෙන දේශීය විදේශීය සංචාරකයින් හා මන්දිරය පසුබිම් කරගෙන මංගල ඡායාරූප ගැනීමට පැමිණෙන්නන්ට අලෙවි කිරීමට මුද්‍රණය කර තිබූ රු.1,306,250ක් වටිනා ටිකට් පොත්, විධිමත්ව ලේඛනයක ඇතුළත් කිරීමෙන් තොරව අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණි.

(ආ) ළමා නිවාසය, විවේකානන්ද පාර්ක් වත්ත හා විවේකානන්ද මන්දිරයේ 2022 වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණය මගින් ලබා දී තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, බඩු වට්ටෝරු පොත්වල රේඛ යාවත්කාලීන කිරීමටත්, මන්දිරයේ ශ්‍රී රෝද රථය ඇතුළු ඇතැම් භාණ්ඩ පොත්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණු අතර ළමා නිවාසයේ ක්‍රීඩා භාණ්ඩ තොගයක් ඇතුළුව පොත්වල ඇතුළත් නමුත් භෞතිකව නොපවතින භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන විදේශ වන්දි මුදල් සම්බන්ධයෙන් විධිමත් තොරතුරු පද්ධතියක්, ගෙවිය යුතු වන්දි මුදල් සම්බන්ධයෙන් නිවැරදි කාල විශ්ලේෂණයක් සහ ලැබෙන්නන් වෙත කරනු ලබන ගෙවීම සටහන් කිරීම සඳහා වූ ලේඛනයක් යාවත්කාලීනව විධිමත් අයුරින් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීමෙන් ගෙවිය යුතු වන්දි මුදල් හඳුනාගත නොහැකි වී තිබුණි.

(ඈ) මියගිය පුද්ගලයන් 250 ක් වෙනුවෙන් ලැබෙන්නන්/නීත්‍යානුකූල උරුමකරුවන් වෙත 2022 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති වන්දි මුදල රු.208,743,268 ක් වුවද වන්දිලාභීන් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි.

(ඉ) වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ස්ථාවර තැන්පතුවල තැන්පත් කර ඇති බාලවයස්කාර ලැබෙන්නන් 443කට අදාළව 2021 දෙසැම්බර් 31 වන විට පැවති රු.236,840,257 ක් වූ ස්ථාවර තැන්පතුවලින් 113 දෙනෙකුගේ උපන් දිනය හඳුනා ගැනීමටත්, උපන් දිනය හඳුනාගත හැකි අවුරුදු 18ට වැඩි බාලවයස්කරුවන් 12 දෙනෙකු වෙනුවෙන් එකතුව රු. 870,847 ක් වූ වන්දි මුදල් ගෙවීමටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 1998 සිට 2004 දක්වා නොගෙවූ විදේශ වන්දි ලෙස හඳුනාගෙන තිබූ රු. 2,196,364 ක මුදලක් රජයේ ගිණුමට බැර කර තිබූ අතර 2004 වර්ෂයේදී එකතුව රු. 539,090 ක් වූ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන්ගේ විස්තර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගෙවීමට නොහැකි වී තිබුණු නමුත් ඒවාට අදාළ තොරතුරු ගෙන්වා ගැනීමටත්, ඊට අදාළ ලිපිගොනු සහ තොරතුරු යාවත්කාලීනව විධිමත් පරිදි පවත්වා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(උ) මුදල්කරුගේ අන්තිම කැමති පත්‍රය අනුව විවේකානන්ද මන්දිරය ළමා නිවාසයක් බවට පත් කළ යුතු බව සඳහන් කර තිබුණ ද, මන්දිරය පසෙකින් පිහිටා ඇති වෙනත් ගොඩනැගිල්ලක

ළමුන් 10 දෙනෙකුටත් අඩු සංඛ්‍යාවක් සහිතව ළමා නිවාසය පවත්වාගෙන යනු ලැබීමෙන් භාරකරුගේ ප්‍රධාන අරමුණ ප්‍රමාණවත් පරිදි ඉටුකර නොමැති බවට නිරීක්ෂණය වූ අතර පාලක මණ්ඩල රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට කටයුතු කර නොතිබීමෙන් නිවාසයට අදාළ තීරණ ගැනීමේ දුර්වලතාවයක් පවතින බව ද නිරීක්ෂණය විය.

(ආ) ඩී. එස්. ඩබ්ලිව්. සමරකෝන් භාරයට අයත් සවිහින්ඩෙල්වත්ත ඉඩමෙහි රජයට පවරාගෙන තිබුණු අක්කර 16 රූඩ් 01 පර්චස් 35ක් වෙනුවෙන් තීරණය වූ වන්දි මුදල අවස්ථා දෙකකදී පිළිවෙලින් රු. මිලියන 2.63 ක් සහ රු. මිලියන 1.79 ක් වශයෙන් වටිනාකම් 2ක් තක්සේරු ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී තිබුණු නමුත් අදාළ වන්දිය නිරවුල් කර ගෙන නොතිබුණි.

(ඇ) 2013 වර්ෂය දක්වා නිසි අයුරින් කළමනාකරණය නොකිරීම හේතුවෙන් වීරසිංහ අයමිගානන්ද භාරයට අයත් මාතර ගබඩා වීදියේ පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැගිල්ල අනවසරයෙන් පදිංචි වූ අයගෙන ඉවත් කිරීම සඳහා නඩු පවරා තිබුණි. ඒ අනුව දේපළ විකුණා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි ජී. එස්. ජයසූරිය නමැති අයගේ භාරය සම්බන්ධයෙන් මහා භාරකාර තැනට හිමිකාමියන් නොමැති වුවද ඒ වෙනුවෙන් පැවරුණු නඩුවට අදාළව නීතිඥ ගාස්තු වශයෙන් එකතුව රු. 2,962,430 ක් ගෙවා තිබූ අතර තවදුරටත් නීතිඥ ගාස්තු ගෙවීම දුරුව පැවතුණි.

(ඉ) හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව සෑම වසරකදීම භාරයේ ආදායමින් 1/5 ක් ඉතිරි කර එම ඉතිරිය රු.100,000 ක් වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්වයන්හිදී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බව දක්වා තිබුණ ද, එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වර්ෂ ගණනාවක සිට ආදායම් ඉතිරි කර නොතිබුණි. එම මුදලෙන් 2021 සහ 2022 වර්ෂවල පමණක් උපයා තිබුණු ආදායම රු. 9,564,983 ක් වූ අතර එයින් ඉතිරි කළ යුතු නමුත් ඉතිරි නොකළ මුදල රු.1,912,997 ක් විය. නිසි කළමනාකරණයකින් යුක්තව වතු පාලනය නොකිරීම හේතුවෙන් භාර ශේෂයක් ඇතිවීම හේතුවෙන් භාරයට අදාළ අරමුණු ඉටු කිරීමට නොහැකිව ඇති බවත් නිරීක්ෂණය විය.

(ඊ) විවෘත නොකරන ලද අන්තිම කැමති පත්‍ර 54 විවෘත කිරීම සම්බන්ධයෙන් වූ නීති කටයුතු වෙනුවෙන් ඩී. එස්. ඩබ්. සමරකෝන් භාරයේ අරමුදල් භාවිතා කර රු.2,629,250 ක් ගෙවා තිබුණු අතර එම භාරයට අදාළව ඉටුකළ යුතු කාර්යයන් භාරකරු විසින් සිය අන්තිම කැමති පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කර තිබූ බැවින් මෙම වියදම් දැරීම භාරකරුගේ අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය කෙරේ.

(උ) භාර සහ මුදල් අයත් අංශවලට වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමටත්, අදාළ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ඌ) 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධි විධාන) පනත මගින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේදී රජය වෙනුවෙන් කොටස් දැරීම සඳහා මහා භාරකාරවරයා නම් කර තිබුණු අතර රජය වෙනුවෙන් මහා භාරකාරතැන විසින් එම සමාගමේ සාමාන්‍ය කොටස් 3,050,379ක් එනම් සියයට 87.5ක හිමිකාරීත්වයක් ලබාගෙන තිබුණි. එසේ වුවද, ඒ සම්බන්ධව හා ඒ මත උපයන ලාභාංශ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ භාර/මුදල් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව නිකුත් කර තිබූ විගණන විමසුම් අතුරින් විමසුම් 15ක් සඳහා කළමනාකරණය විසින් පිළිතුරු සපයා නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ 77ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් සත්‍ය කාර්ය මණ්ඩලය 72 ක් වූයෙන් තනතුරු 5 ක් පුරප්පාඩු වී පැවතුණි.

(ආ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වර්ෂ 5ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්මූ වූ නිලධාරීන් 22 ක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

ආර්.එම්.එම්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක**

**ආයතනයේකාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** | **50% අඩු** |
| 1.ශිෂ්‍යාධාර ගෙවීම | - | - | 70% | - |
| 2.වෛද්‍යාධාර ගෙවීම | - | 82% | - | - |
| 3.ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය සඳහා ගෙවීම | 91% | - | - | - |
| 4.පුණ්‍යාධාර ගෙවීම | 93% | - | - | - |
| 5. අසරණාධාර ගෙවීම | 94% | - | - | - |
| 6.පුද්ගල භාර ගෙවීම් | 159% | - | - | - |
| 7.භාර අරමුණු අනුව වෙනත් ගෙවීම් | 172% | - | - | - |
| 8. විහාර වන්දි නිදහස් කිරීම | - | - | - | 20% *** |
| 9. විදේශ වන්දි නිදහස් කිරීම | - | 75% | - | - |
| 10.වතු කළමනාකරණය | | | | (26%) |

***** විහාර වන්දි නිදහස් කිරීම ලැබෙන ඉල්ලීම් අනුව සිදු කෙරේ.**

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධනඅරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%-49%** | **50%-74%** | **75%-100%** |
| සමානාත්ම ගුණාත්ම අධ්‍යාපනය | ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම | ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | - | 70% | - |
| සෞඛ්‍ය ප්‍රවර්ධනය | රෝගීන් සඳහා ආධාර ලබා දීම | රෝගීන් සංඛ්‍යාව | - | - | 82% |
| භෞමික පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම | පුණ්‍යාධාර ගෙවීම් | පුණ්‍යාධාරලාභීන් සංඛ්‍යාව | - | - | 93% |
| දරිද්‍රතාවය අවසන් කිරීම | අසරණාධාර ගෙවීම් | අසරණාධාරලාභීන් සංඛ්‍යාව | - | - | 94% |
| සාමකාමී සාධාරණ ආයතන බිහි කිරීම | ආයතන වලට හා සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම | ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව | - | - | 91% |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 08 | 06 | 02 |
| තෘතියික | 02 | 01 | 01 |
| ද්විතියික | 61 | 48 | 13 |
| ප්‍රාථමික | 17 | 17 | 00 |

ද්විතීය මට්ටමේ නිලධාරීන්ගෙන් කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) නිලධාරීන් 19 පෞද්ගලික වන සේ බඳවාගෙන ඇති බැවින් එම නිලධාරීන් සේවයෙන් ඉවත් වූ පසු තනතුර අහෝසි වන අතර මෙම පුරප්පාඩු සම්පූර්ණ වීමක් සිදු නොවේ. මේ වන විට නිලධාරීන් 11 දෙනෙක් කළමනාකරණ සේවා නිලධාරීන් ලෙස උසස් වීම් ලබා කාර්යාලයෙන් මාරු වී ඇත.

### 06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

මහාභාරකාර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 88 ක් වන අතර මේ වන විට නිලධාරීන් 16 ක පුරප්පාඩුවක් පවතී. දෙපාර්තමේන්තුව වෙත බඳවාගෙන ඇති (කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන කණ්ඩ 2) නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරීන් ලෙස උසස් වීම් ලැබ ආයතනයෙන් මාරු වී ගොස් ඇති අතර ඒ සමඟ අදාල තනතුර අහෝසි වන බැවින් එය ආයතනයේ කාර්ය සාධනයට සෘජුවම බලපා ඇත. මේ සඳහා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීමට පියවර ගනිමින් පවතී.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශිය / විදේශිය ) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශිය | විදේශිය | | |
| කාර්යාල ක්‍රම | 04 | දින 2 | රු.4000.00 | - | දේශිය | කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| Smart Office | 02 | 03 | රු.36,000.00 | - | " | පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම |
| රජයේ වාහන නඩත්තුව | 01 | 01 | රු.5,000.00 | - | " | වාහන නඩත්තුව පිළිබඳව දැනුම |
| කාර්යාල කලමණාකරනය හා මූල්‍ය රෙගුලාසි | 02 | 02 | රු.20,000.00 | - | " | කාර්යාල කලමණාකරනය හා මූල්‍ය රෙගුලාසි පිළිබඳව දැනුම |
| අභ්‍යන්තර විගණනය | 02 | 03 | රු.60,000.00 | - | " | අභ්‍යන්තර විගණනය පිළිබඳව දැනුම |
| විනය කාර්යය පටිපාටිය | 01 | 02 | රු.9500.00 | - | " | විනය කාර්යය පටිපාටිය පිළිබඳව දැනුම |
| රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 01 | 01 | රු.5,000.00 | - | " | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳව දැනුම |
| දෙමල භාෂා පාඨමාලාව | 22 | 25 | - | - | " | දෙමල භාෂාව පිළිබඳව දැනුම |
| ළමා අපචාර හා කාන්තාවන්ට සිදුවන අපරාධ යන මැයෙන් දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්විනි. | සියළුම නිලධාරින් | 01 | රු.36,700.00 | - | - | ළමා අපචාර හා කාන්තාවන්ට සිදුවන අපරාධ හා ඒවා වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම |
| අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාව විසින් අල්ලස හා දූෂණය පිටුදැකීම යන මාතෘකාවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විනි. | සියළුම නිලධාරින් | 01 | - | - | - | අල්ලස් හා දූෂණය පිටුදැකීම පිළිබඳ දැනුම |

**07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුමේ නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දැනති අංක 171/2004 දරණරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගතණනවිමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 6 | **අභයන්තරවිගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරණජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණකමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම්කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණවත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රෙල්ඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමසම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේක අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිතභාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණරාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අදාල නොවේ | - | - |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| 12 | **රජයේනිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කර තිබීම | අදාල නොවේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නොවේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | - | - |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017දිනැතිMSDචක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දිමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබිම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණරාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛ 2.3 ඡේදයපරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩටසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

**අවසානය.**